2019.12.31 ලංකාදීප

# 2020 ආර්ථිකය සුබ වේවිද?

ප්‍රවීණ ආර්ථික විශ්ලේෂක
**වින්සන් මර්වින් ප්‍රනාන්දු**

උදාවන 2020 නව වසර කරුණු හතරක් නිසා වැදගත්ය. පළමුව එය නව දශකයක ආරම්භක වසර [illegible] නව රජයේ පළමු නව වසර වීමය. 2015-2019 දක්වා ක්‍රමයෙන් පිරිහුණු [illegible] සහ ආර්ථික වර්ධන වේගය ඉහළ නංවමින් [illegible]ට පසු යහපත් ආරක්ෂිත පරිසරයක් මැද වැඩිම වර්ධන වේගය වාර්තා කිරීමට නව රජය කටයුතු කරමින් සිටීමය. සිව්වැනුව ජනපති වීමට පෙර රටට ඉදිරිපත් කරන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දැක්වූ 2020-2025 කාලය තුළ ළඟා කර ගැනීමට අපේක්ෂා කළ අරමුණු 7 වන ආර්ථික වර්ධනය සියයට 6.5ක් බවට පත් කිරීම ඒකපුද්ගල ආදායම් ඩොලර් 6500ක් දක්වා ඉහළ නැංවීම, සේවා වියුක්ති අනුපාතිකය සියයට 4ක් කිරීම, උද්ධමන වේගය සියයට 5 ක මට්ටමක තබා ගැනීම, අයවැය හිඟය සියයට 5කට මට්ටමකට ගෙන ඒම, ණය පොලී අනුපාතික සියයට 10කට වඩා අඩු කිරීම සහ විදේශ විනිමය අනුපාතිකය ඩොලර් 1ක් රු. 182 ක ස්ථාවර මට්ටමකට ගෙන ඒම යන ඉලක්ක 7ම ළඟා කර දෙන වර්ෂයක් බවට 2020 පත්වන ලකුණු පහළ වී තිබීමය. ඒ පිළිබඳව විමසීම මෙම ලිපියේ ප්‍රධාන අරමුණයි.

නව රජයේ පළමු ආර්ථික ඉලක්කය ''ආර්ථික වර්ධනය (Economic Growth) සියයට 6.5ක මට්ටමට ගෙන ඒමය. 2015-2019 කාලයේ බලයේ සිටි යහපාලන ආණ්ඩුව එම කාලය තුළ අපේක්ෂා කළ වර්ධන ඉලක්කය ද සියයට 6.5ක් වූ අතර ළඟා කරගත් වර්ධන වේගයත් සමග සසඳන විට ඒ දෙක අතර පරතරය මෙසේ විය

**2015-2019 වර්ධන ඉලක්කය - 6.5%**

**2015-2019 සත්‍ය වර්ධනය - 3.4%**

**අපේක්ෂිත වර්ධන අඩු වීම - 3.1%**

2015 සිට ම වර්ධන වේගය ක්‍රමයෙන් අඩු වූ යුගයක් ලෙස හා ඉලක්කය සියයට 50 කින් අඩු කරගත් යුගයක් ලෙස 2015 - 2019 ඉතිහාසගත වෙයි. මේ තත්ත්වය මග හරවමින් 2020-2025 දක්වා සියයට 6.5ක වර්ධනයක් ඉලක්ක කර ගෙන බලයට පැමිණි වත්මන් රජයට එම ඉලක්කයට හා අනිකුත් ඉලක්කයනට ළඟා විය හැක්කේ පෙර රජයේ පැවැති ඉලක්ක ළඟා කිරීමට බාධාකාරී වූ ප්‍රධාන දුර්වලතා මග හරවා ගත්තොත් පමණි යන්න අපගේ නිගමනය යි. එයින් පළමුවැන්න නම් ජනපති හා අගමැති අතර ගැටුම් වළක්වා ගැනීමය. කලින් යහපාලන ආණ්ඩුවේ ජනපති ධුරය දැරූ මෛත්‍රීපාල සිරිසේන හා අගමැති ධුරය දැරූ රනිල් වික්‍රමසිංහ හා අතර ප්‍රතිපත්තිමය වශයෙන් හා ආර්ථික තීරණ ගැනීම්වලදී ඇති වූ ගැටුම් මෙන්ම දේශපාලනික වශයෙන් ඇති වූ මතවාද රටේ වර්ධනය ක්‍රමයෙන් පිරිහීමට ප්‍රධානතම හේතුව විය.

දෙවැන්න වූයේ 2015 - 2017 දක්වා මුල් වසර 3 තුළ ''ආර්ථික කළමනාකරණය පිළිබඳ කමිටුව (CCEM) අගමැති යටතේ පැවතීමත් 2018 - 2015 වසර දෙක තුළ ක්‍රියාත්මක වූ ''ජාතික ආර්ථික මණ්ඩලය'' ජනාධිපති යටතේ පැවතීමත්ය. ඒවා අතර ඇති වූ ගැටුම් හා නොගැළපීම් නිසා රටේ වර්ධනය පහතට වැටුණේය.

එහෙත් මෙවර බලයට පත්ව සිටින්නේ එකම පක්ෂයක මෙන් ම එකම පවුලකට සම්බන්ධ දෙදෙනෙකි. ජනපති ගෝඨාභය මහතා මල්ලිය. අගමැති මහින්ද රාජපක්ෂ මහතා අයියාය. එවැනි තත්ත්වයක් තුළ බැලූ බැල්මට දේශපාලන ගැටුමක් ඇති වන බවක් නම් පෙනෙන්නට නැත. එසේම වත්මත් රජය ''ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් කොමිසමක්'' (NPPC) ජනාධිපති තුමා විසින් පිහිටුවා තිබෙන අතර එවැනි කමිටුවක් අගමැති යටතේ පිහිටුවා නැත. ඒ නිසා බැලූ බැල්මට ජනපති හා අගමැතිගේ කියා ආර්ථික කමිටු හෝ දෙදෙනාගේ ආර්ථික උපදේශකයින් අතර ද ගැටුමක් නැති බව පෙනේ. මේ වනවිට කීර්තිමත් පුද්ගලයන් තිදෙනකුට ජනාධිපති ලේකම්, අගමැති ආර්ථික උපදේශ ධුරය හා මහ බැංකු අධිපති ධුර භාර දී ඇත. රටේ ප්‍රධාන පෙළේ රාජ්‍ය ආයතනවලට ප්‍රධානීන් පත් කිරීමට විශේෂ කමිටුවක් ද පිහිටුවා තිබෙන අතර ඒ හරහා 'දක්ෂතම පිරිස් අදාළ තනතුරුවලට පත් කරන බව' ද දැනුම් දී ඇත. එසේ පත්වන ප්‍රධානීන් වසරක් තුළ වැඩ නොපෙන්නුවොත් ගෙදර යන්න සූදානම්ව සිටින ලෙස ද ජනපතිවරයා දැනටමත් ප්‍රකාශ කොට ඇත. ''වැරදි කරන අයට දඬුවම් දීම'' ද ආරම්භ කර තිබෙන අතර විශාල වැරදි ලෙස හුවා දැක්වූ ''බැඳුම්කර මගඩිය'' හා ''පාස්කු දින ත්‍රස්තවාදී ප්‍රහාරයට'' සම්බන්ධ පිරිස් සොයා බලා ඉදිරියේ දී ඔවුන්ට ද දඬුවම් දෙන බව ප්‍රකාශයට පත් කොට ඇත. එම කටයුතු ද ඉතාම ඉක්මනින් සිදු කරනු ඇතැයි ජනතාව අපේක්ෂා කරයි.

රටේ ආරක්ෂාව ද මේ වන විට ඉතාම ඉහළ තත්ත්වයක තිබෙන බව මෙවර නත්තල කිසිදු බියක් නැතිව දැඩි ආරක්ෂිත පරිසරයක් තුළ සැමරීමට වත්මන් ආණ්ඩුව පරිසරය සැකසීම කාගෙන් පැසසුමට ලක් වී ඇත.

රජය පොරොන්දු වූ ආර්ථික ඉලක්ක 7 ළඟා කිරීමට රජය සූදානම් බව පෙන්නුම් කරමින් මේ වන විටත් එලදායී ආර්ථික තීරණ පහක් ගෙන තිබේ.

පළමුව - ජනතාව මත පටවා තිබුණු අධික බදු බර අඩු කොට විශාල පිරිසකට සහන සලසා තිබීම දැක්විය හැකිය. මේ හරහා ඉදිරියේ දී බඩු මිල අඩු වීමට ආයතනවල ආදායම් ඉහළ ගොස් ලාභ වැඩිවීමට ඒ නිසාම ආයෝජන වැඩි වී නිමැවුම වැඩි වී වර්ධනය ඉහළ යාම රැකියා සුලභවීම, උද්ධමනය අඩුවීමට දිගු කාලයේ දී රාජ්‍ය ආදායම් වැඩි වී අයවැය හිඟය අඩුකර ගැනීමට හැකි වේ යැයි අපේක්ෂා කෙරේ.

දෙවැනිව, බදු අඩුවීම හා ආර්ථිකය කෙරෙහි විශ්වාසට ඇතිවීම හරහා විදේශීය ආයෝජන ඉහළ ගොස් රටේ ගෙවුම් තුලනය ශක්තිමත් වී විදේශ විනිමය අනුපාතිකය ස්ථාවරව තබා ගැනීමට හැකිවීම දැක්විය හැකිය.

තෙවනුව - පැවති ඉහළ පොලී අනුපාතික නිසා රාජ්‍ය ණය පොලී ගෙවීම් ද ඉහළ ගිය අතර රාජ්‍ය අයවැය හිඟය වැඩිවීමට රාජ්‍ය ණය බර වැඩිවීමට හේතු වීම නිසා ණය පොලී අනුපාතිකය සියයට 10කට වඩා අඩු මට්ටමකට ගෙන ඒමට පියවරක් වශයෙන් 2019 වසරේ අවසාන මුදල් මණ්ඩල රැස්වීමේ දී ප්‍රතිපත්ති පොලී තවදුරටත් අඩු කොට මූල්‍ය ප්‍රතිපත්තිය තව දුරටත් ලිහිල් කිරීමට කටයුතු කිරීමට තීරණය කර ඇති බව මෙම ලිපිය ලියන මොහොතේ දැක ගන්නට ලැබිණි.

සිව්වැනුව - හාල් මිල අඩු කිරීමට ජනපතිවරයා පෞද්ගලිකව මැදිහත් වීමත්

පස්වැනුව- දුගී දුප්පත් පවුල් ලක්ෂයකට රජයේ රැකියා ලබාදීමේ වැඩසටහනක් නව වසරේ මුල සිට ක්‍රියාත්මක වීමත් ඒ හරහා රජයේ සහනාධාර වියදම් අඩු වී අයවැවට ඇති බර අඩු කර ගැනීමටත් අපේක්ෂා කෙරේ. එසේම රජයේ නාස්තිකාර වියදම් ද අඩු කරමින් සිටී. දැනට ගෙන තිබෙන මේ සඵලදායී ක්‍රියාමාර්ග හරහා රජයේ ආර්ථික ඉලක්ක සියල්ලම සාර්ථකව ළඟා කර ගැනීම 2020 සිටම ඇරැඹෙන නිසා 2020 නව වසර ආර්ථික වශයෙන් සුබ වසරක් වීම වැළැක්විය නොහැකිය. ඔබට සුබ නව වසරක් වේවා.